# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - ජනවාරි 2026

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

---

## A - කොටස

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම සුදුසු පිළිතුරට අදාල අංකයද, ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති එක් එක් ප්‍රකාශය **'සත්‍ය'** හෝ **'අසත්‍ය'** හා ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා වූ ප්‍රශ්න සඳහා නිවැරදි උත්තරය ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන ලෙස අයදුම්කරුවන් වෙත උපදෙස් ලබා දී තිබුණි.

අයදුම්කරුවන් එක් එක් අනු කොටස් සඳහා ලබා දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු දුර්වලතා කිහිපයක් පහත පරිදි වේ:

**ප්‍රශ්න අංක 1.1**

මෙම ප්‍රශ්නයේදී "ගිණුම්කරණ නිමැවුමක් වන්නේ පහත සඳහන් කවරක් ද" යන්න විමසන ලදී. අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් නිවැරදි පිළිතුර (4) "ආදායම් ප්‍රකාශනය" ලබා දී තිබුණද, සමහර අයදුම්කරුවන් වැරදි පිළිතුර (1) "ශේෂ පිරික්සුම" පිළිතුර ලෙස සඳහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.2**

"පහත සඳහන් ඒවායින් මූලික සටහන් පොතක් නොවන්නේ කුමක්ද" යනුවෙන් විමසන ලදී. සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් නිවැරදි පිළිතුර (1) "ලෙජරය" ලබා දී තිබූ අතර, සමහර අයදුම්කරුවන් වැරදි පිළිතුරු (3) "පොදු ජර්නලය" ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.3**

"ගිණුම්කරණ ශිල්පියෙකු විසින් අනුගමනය කරනු ලබන ආචාරධර්ම සංග්‍රහයේ මූලධර්මයක් වන්නේ කුමක්ද" යනුවෙන් විමසන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු අංකය (4) "ඉහත සඳහන් සියල්ලම" යන උත්තරය ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.4**

"ලබා දී ඇති තොරතුරු මත පදනම්ව 2025 මාර්තු 31 වන දිනට **පෙරේරා ට්‍රේඩර්ස්** හි වගකීම්" විමසන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව ගණනය කර නිවැරදි පිළිතුර වන (2) "රු.1,450,000 /-" ඉදිරිපත් කර තිබුණි, නමුත් සමහර අයදුම්කරුවන් වැරදි ලෙස ගණනය කිරීම් සිදුකර, ඔවුන්ගේ වැරදි ගණනය කිරීම් මත පදනම්ව වැරදි පිළිතුර (1) "රු. 3,050,000 /-", ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.5**

"ලබා දී ඇති තොරතුරු මත පදනම්ව, දී ඇති ගිණුම්කරණ සමීකරණය සඳහා වඩාත් සුදුසු ගනුදෙනුව කුමක්ද" යනුවෙන් විමසන ලදී . බොහෝ අයදුම්කරුවන් නිවැරදි පිළිතුර (3) පිරිවැය "රු.65,000 /- ක භාණ්ඩ, රු.90,000/- කට ණයට විකුණන ලදී" යනුවෙන් ඉදිරිපත් කර ඇති අතර සමහර අයදුම්කරුවන් එය (1) "රු.65,000/- ක් වූ භාණ්ඩ රු.90,000/- ක මුදලට විකුණන ලදී" ලෙස වැරදි උත්තර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.6**

"තම ආයෝජනවල ආරක්ෂාව සහතික කරමින් සමාගමේ ලාභදායීතාවය සහ ස්ථාවරත්වය කෙරෙහි මූලිකව උනන්දුවක් දක්වන ඇල්මැති පාර්ශවය" කවුරුන්ද යන ප්‍රශ්නය අසන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර (1) "කොටස්හිමියන්" ලෙස ඉදිරිපත් කර ලකුණු ලබාගෙන ඇත.

**ප්‍රශ්න අංක 1.7**

"දී ඇති ගනුදෙනුව ව්‍යාපාර ලෙජර් ගිණුම්වල සටහන් කිරීමේ නිවැරදි ක්‍රමය කුමක්ද" යන ප්‍රශ්නය අසන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර වන (2) ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.8**

"මුදල් ලැබීම් නොසළකා නිශ්චිත ගිණුම්කරණ කාලපරිච්ඡේදයක් තුළ අයහාරය (ආදායම්) ගිණුම්කරණ සංකල්පය කුමක්ද යන්න හඳුනාගනු ලැබේ" යනුවෙන් අසන ලද ප්‍රශ්නයට, බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර (3) "උපචිත සංකල්පය" ලබා දී ඇති අතර, සමහර අයදුම්කරුවන් (1) හෝ (4) වැනි වැරදි පිළිතුරු ද ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.9**

2025 දෙසැම්බර් 31 වන දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය පිළිබඳව ලබා දී ඇති තොරතුරු මත පදනම්ව මෙම ප්‍රශ්නය අසන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව ගණනය කර නිවැරදි පිළිතුර වන "(1) රු.454,000/-" ලෙස ඉදිරිපත් කර තිබුණි, සමහර අයදුම්කරුවන් වැරදි ලෙස ගණනය කර ඔවුන්ගේ වැරදි ගණනය කිරීම් මත පදනම්ව "(2) රු.494,000/-" යන වැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.10**

මෙම ප්‍රශ්නය මගින් අයදුම්කරුවන්ගේ ගිණුම්කරණ සංකල්ප පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. "සිද්ධියට අදාළ ගිණුම්කරණ සංකල්පය ව්‍යාපාරයේ හිමිකරුගේ විදුලි බිල්පතක් ව්‍යාපාරය විසින් ගෙවන ලද අතර එය ව්‍යාපාරයේ ගැනිලි ලෙස සලකනු ලැබීය" යනුවෙන් අසන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර "(3) අස්තිත්ව සංකල්පය" ඉදිරිපත් කර ඇති අතර තවත් සමහරු වැරදි පිළිතුරු (2) හෝ (4) ඉදිරිපත් කර තිබුණි.

ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා අයදුම්කරුවන් වෙත ලබා දී ඇති එක් එක් ප්‍රකාශය **"සත්‍ය"**හෝ **"අසත්‍ය"** ලෙස උත්තර පත්‍රයේ සඳහන් කළ යුතුය. බොහොමයක් අයදුම්කරුවන් **1.11, 1.13** සහ **1.14** ප්‍රශ්නවලට අදාළව කරන ලද ප්‍රකාශ නිවැරදිව තේරුම් ගෙන නිවැරදි පිළිතුරු ලියා තිබුණි.

**1.12** සහ **1.15** ප්‍රශ්නවලට අදාළව කරන ලද ප්‍රකාශ නිවැරදිව තේරුම් ගෙන නොතිබූ අතර වැරදි පිළිතුරු සපයා තිබුණි.

**ප්‍රශ්න අංක 1.16**

"වත්කමක්" යන පදය නිර්වචනය කරන ලෙස ඉල්ලා ඇත . සැලකිය යුතු  අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නයට සම්පූර්ණ හා නිවැරදි පිළිතුරක් ලබා දීමට අපොහොසත් වී ඇත. ඔවුන්ගෙන් බොහොමයක් දෙනෙක් අසම්පූර්ණ පිළිතුරු ලබා දී ඇති අතර අර්ථ දැක්වීම් කෙරෙහි අවධානය යොමු කර නොමැත. තවත් සමහර අයදුම්කරුවන් වත්කම් යනු ප්‍රාග්ධනය සහ වගකීම්වල එකතුව බව සඳහන් කර ඇත.

**ප්‍රශ්න අංක 1.17**

පොදු ජර්නලයේ සටහන් කරනු ලබන ගනුදෙනු වර්ග දෙකක් (02) සඳහන් කරන ලෙස ඉල්ලා ඇත. පිළිතුරෙහි ගනුදෙනු වර්ග දැක්විය යුතු බව සඳහන් කර තිබුණද, අයදුම්කරුවන් පොදු ජර්නලයේ සටහන් කරන ගනුදෙනු සඳහා උදාහරණ සපයා තිබුණි.

**ප්‍රශ්න අංක 1.18**

"අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය" කෙටියෙන් පැහැදිලි කරන ලෙස ඉල්ලා ඇත. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සම්පූර්ණ හා නිවැරදි පිළිතුරක් ලබා දීමට අපොහොසත් විය. ඔවුන්ගෙන් බොහොමයක් දෙනෙක් අසම්පූර්ණ පිළිතුරු ලබා දී තිබුණේ "අඛණ්ඩ පැවැත්ම" යන්නෙන් අදහස් කරන්නේ ව්‍යාපාරය වසරකට වැඩි කාලයක් පවතින බවයි, නැතහොත් ලබා දුන් පිළිතුර වූයේ ව්‍යාපාරයේ හිමිකරුවෙකු නොමැති වුවද ව්‍යාපාරය දිගටම පවතින බවයි.

**ප්‍රශ්න අංක 1.19**

ආදායම් ප්‍රකාශනයේ මූලිකාංග දෙක (02) සඳහන් කරන ලෙස ඉල්ලා ඇත. බොහොමයක් අයදුම්කරුවන් ආදායම් සහ වියදම් ලෙස නිවැරදි පිළිතුරු ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 1.20**

**(a)** සහ **(b)** සම්බන්ධ එක් එක් ගනුදෙනුව වාර්තා කිරීම සඳහා භාවිතා කරන අදාළ මූලික  ලියවිල්ල හඳුනා දැක්වීමට උපදෙස් ලබා දෙන ලදී. බොහොමයක් අයදුම්කරුවන්ට ජර්නල් වවුචර් සහ රිසිට්පත ලෙස නිවැරදි පිළිතුරු ලබා දී ඇති අතර, අයදුම්කරුවන් සුළු සංඛ්‍යාවක් වැරදි පිළිතුරු ලබා දී තිබුණි. **(a)** පොදු ලෙජරය, ඉන්වොයිසිය, හර පත සහ **(b)** ඉන්වොයිසිය, බැරපත සඳහා උදාහරණ.

## B - කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න 4 කින් සමන්විත වූ අතර, එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් ලබා දී තිබුණි.

**ප්‍රශ්න අංක 02 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) පිළියෙල කිරීම සම්බන්ධයෙන් බොහොමයක් අයදුම්කරුවන්ගේ දැනුම සහ අවබෝධය මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරන ලදී.

මෙම ප්‍රශ්නයට බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබූ අතර, පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:

(1) සමහර අයදුම්කරුවන් නිෂ්පාදන ගිණුම් පිළිබඳව දැනුවත්ව නොසිටි අතර, ප්‍රශ්නය සඳහා විවිධ ආකෘතීන් සහ විවිධ ගණනය කිරීම් භාවිතා කර තිබුණි.

(2) වර්ෂය ආරම්භයේ සහ අවසානයේ නොනිමි තොග "ප්‍රාථමික පිරිවැයට අගය කර ඇත" යනුවෙන් පැහැදිලිව සඳහන් කර තිබුණද, සමහර අයදුම්කරුවන් එය ප්‍රාථමික පිරිවැයට නොගැලපා නිෂ්පාදන පිරිවැයට ගැලපීම සිදු කර තිබුණි.

(3) සෘජු වැටුප් ප්‍රාථමික පිරිවැයට ගැලපිය යුතු වුවද, සමහර අයදුම්කරුවන් එය පොදු කාර්ය පිරිවැයක් ලෙස සලකනු ලැබීය.

(4) අමුද්‍රව්‍යවල අවසන් තොගය ආරම්භක අමුද්‍රව්‍ය තොගය සමඟ පටලවාගෙන ඉදිරිපත් කර තිබුණි.

(5) අවසන් නොනිමි තොග ආරම්භක නොනිමි තොගු සමඟ පටලවා ගෙන ඉදිරිපත් කර තිබුණි.

(6) සමහර අයදුම්කරුවන් නිෂ්පාදන පිරිවැයෙන් 20% ක ලාභ ආන්තිකය නිවැරදිව ගණනය කර නොතිබුණි.

(7) පරිභෝජනය කරන ලද අමුද්‍රව්‍යවල පිරිවැය ගණනය කරන ලද ප්‍රාථමික පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය තුළ සඳහන් කර නොමැත.

(8) ලබා දී ඇති ප්‍රතිශතයන් කර්මාන්ත ශාලාව සහ කාර්යාලය අතර විදුලිය, ජලය සහ කුලිය බෙදා හැරීම සඳහා භාවිතා කර නොතිබුණි. නිෂ්පාදන පොදු කාර්ය කර්මාන්ත ශාලාව සහ කාර්යාලය අතර බෙදා වෙන් කර නොතිබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය මගින් ලෙජර් ගිණුම් පිළියෙල කිරීමෙන් පසු ශේෂ පිරික්සුම පිළියෙල කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා තිබූ අතර, පහත සඳහන් දුර්වලතා සාමාන්‍යයෙන් නිරීක්ෂණය විය:

(1) ශේෂ පිරික්සුම පිළියෙල කිරීම වෙනුවට සමහර අයදුම්කරුවන් ලෙජර් ගිණුම් පමණක් සකස් කර තිබුණි.

(2) සමහර අයදුම්කරුවන්ට ද්විත්ව සටහන් මූලධර්මය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් නොමැති බව නිරීක්ෂණය විය.

(3) ශේෂ පිරික්සුමක හර ශේෂයන් ලෙස පෙන්විය යුතු ඇතැම් වත්කම් සහ වියදම් ශේෂයන් බැර ශේෂයන් ලෙසත්, බැර ශේෂයන් ලෙස පෙන්විය යුතු ඇතැම් වගකීම් සහ ආදායම් ශේෂයන් හර ශේෂයන් ලෙසත් පෙන්වන ලදී.

(4) වෙළඳ ණයගැතියන් සහ වෙළඳ ණයහිමියන්ගේ පාලන ගිණුම් හරහා ණය මත විකුණුම් සහ ණය මත මිලදී ගැනීම් නිවැරදිව ගණනය කර නොතිබුණි.

(5) අත්පිට විකුණුම්, ණයට විකුණුම් සහ අත්පිට ගැනුම් සහ ණයට ගැනුම් වෙනම අයිතම ලෙස ශේෂ පිරික්සුමේ සටහන් කර තිබුණි.

(6) 2025 අප්‍රේල් 01 දින මිලදී ගත් ස්වයංක්‍රීය කෝපි යන්ත්‍රයේ ක්ෂයවීම් නිවැරදිව ගණනය කර නොතිබුණි.

(7) සුළු මුදල් පොතට මාරු කරන ලද මුදලින් ගෙවන ලද සුළු මුදල් වියදම් අඩු කිරීමෙන් පසු ඉතිරි සුළු මුදල් ශේෂය වන රු.15,000/-, ශේෂ පිරික්සුමේ සඳහන් කර නොතිබුණි.

(8) සුළු මුදල් වියදම් තනි තනිව වර්ගීකරණය කර නොතිබූ අතර එම වියදම්වල එකතුවක් ලෙස ශේෂ පිරික්සුමේ සඳහන් කර තිබුණි.

(9) 2025 ඔක්තෝබර් 01 වන දින 8% ක වාර්ෂික පොලී අනුපාතයකට විවෘත කරන ලද ස්ථාවර තැන්පතුවට අදාළව මාස 03 ක පොලී ආදායම නිවැරදිව ගණනය කර නොතිබුණි.

(10) ගිණුම්කරණ කාලපරිච්ඡේදය සඳහා උපචිත වියදම් සමග විදුලි හා ජල බිල්පත් ගාස්තු නිවැරදිව ගණනය කර නොතිබුණි.

(11) ගිණුම්කරණ කාලපරිච්ඡේදය සඳහා උපචිත වියදම් සමග කුලී ගාස්තු නිවැරදිව ගණනය කර නොතිබුණි.

## ප්‍රශ්න අංක **04** - ලකුණු 10

**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය මගින් අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම පිළිබඳ දැනුම සහ අවබෝධය පරීක්ෂා කර ඇත. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට උත්තර ලිවීමට උත්සාහ කර තිබූ අතර, සපයා තිබූ පිළිතුරුවල පහත දුර්වලතාවයන් දක්නට ලැබුණි.

මෙම ප්‍රශ්නය පොදු ජර්නලය සහ අවිනිශ්චිත ගිණුම සඳහා පිළිවෙලින් **(a)** සහ **(b)** ලෙස කොටස් දෙකකින් සමන්විත වේ.

**(a)**

(1) බොහොමයක් අයදුම්කරුවන් ක්ෂයවීම් නිවැරදිව ගණනය කර වාර්තා කර නොමැති අතර, එයට හේතුව යම් කාලපරිච්ඡේදයක් සඳහා ක්ෂයවීම් ගණනය කිරීම පිළිබඳව අයදුම්කරුවන්ට ප්‍රමාණවත් දැනුමක් නොමැතිකමයි.

(2) දැනුම නොමැතිකම නිසා බොහොමයක් අයදුම්කරුවන් ගැනිලි හා සම්බන්ධ ගනුදෙනුවට පිළිතුරු සැපයීමට අපොහොසත්ව තිබුණි.

(3) හර සහ බැර ගනුදෙනු සඳහා පැහැදිලි ඉදිරිපත් කිරීමක් නොමැත.

(4) බොහොමයක් අයදුම්කරුවන් සෑම ජර්නල් සටහනක් සඳහාම මුදල් පොත භාවිතා කර තිබුණි.

(5) උපචිත ගිණුම්කරණය පිළිබඳ දැනුම නොමැතිකම නිසා, බොහොමයක් අයදුම්කරුවන් උපචිත වියදම් ගැලපුම සඳහා පිළිතුරු සැපයීමට අපොහොසත්ව තිබුණි.

**(b)**

(1) අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂය නිවැරදිව සඳහන් කර නොමැත.

(2) ගනුදෙනු නිවැරදි කිරීමේ දී සඳහා බොහොමයක් අයදුම්කරුවන් හර සහ බැර පැති නිසි ලෙස සඳහන් කර නොමැත.

## ප්‍රශ්න අංක **05** - ලකුණු 10

**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය **(a)** සහ **(b)** වශයෙන් අනු කොටස් දෙකකින් සමන්විත වේ.

ගිණුම්කරණ සමීකරණ සහ බැංකු සැසඳුම් පිළිබඳ දැනුම සහ අවබෝධය විභාගකරු විසින් පරීක්ෂා කර ඇත. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර ඇති අතර, පහත සඳහන් දුර්වලතාවය හඳුනාගත හැකිය.

ගිණුම්කරණ සමීකරණ සහ බැංකු සැසඳුම් සඳහා පිළිවෙලින් **(a)** සහ **(b)** ලෙස ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වේ.

**(a)** බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයේ මෙම කොටසට උත්තර ලිවීමට උත්සාහ කර නිවැරදිව පිළිතුරු සපයා ඇත. කෙසේවෙතත්, සමහර අයදුම්කරුවන්ට සමීකරණය පිළිබඳ දැනුමක් නොතිබුණි. එනම්, සමීකරණය භාවිත කරන්නේ ඇයිද යන්නයි. තවද, ප්‍රශ්නයේදී, පරීක්ෂකවරයා පිළිතුරු දීමට සමීකරණය ලබා දී ඇත, නමුත් සමහර අයදුම්කරුවන් තම පිළිතුරු ඉදිරිපත් කිරීමට තමන්ගේම සමීකරණ භාවිත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට යම් ලකුණු ප්‍රමාණයක් අහිමි විය.

තවද, සමහර අයදුම්කරුවන් ජර්නල් සටහන් සහ ලෙජර ගිණුම් හරහා පිළිතුරු සැපයීමට උත්සාහ කළ බව නිරීක්ෂණය විය. නමුත්, මෙම ප්‍රශ්නය යටතේ ඒවා පරීක්ෂා නොකළ අතර, ඒ අනුව, ප්‍රශ්නයට නිසි ලෙස පිළිතුරු සැපයීමට අපොහොසත් වීම නිසා ඔවුන්ගේ ගිණුම්කරණ දැනුම නොසලකා ලකුණු අහිමි වී තිබුණි.

**(b)** අයදුම්කරුවන්ගේ බැංකු සැසඳුම් පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටසට ලිවීමට උත්සාහ කර නිවැරදිව පිළිතුරු සපයා ඇත. කෙසේවෙතත්, සමහර අයදුම්කරුවන්ට මුදල් පොත සහ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ අඩංගු අංග පිළිබඳව දැනුමක් නොමැති බව නිරීක්ෂණය විය.

## C - කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය කේවළ ස්වාමි ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිළියෙල කිරීම සඳහා වූ අතර එය **(a)** සහ **(b)** ලෙස කොටස් 2 කින් සමන්විත විය. **(a) කොටස** විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම පරීක්ෂා කිරීම සඳහා වූ අතර **(b) කොටස** මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සකස් කිරීම පරීක්ෂා කිරීම සඳහා විය. සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.

පොදුවේ නිරීක්ෂණය වූ වැරදි හා අඩුපාඩු පහත පරිදි වේ:

**(a) විස්තීර්ණ ආදායම් ප්‍රකාශය:**

(1) සමහර අයදුම්කරුවන් වැරදි අවසන් තොග සටහනක් හේතුවෙන් දළ ලාභය වැරදි ලෙස ගණනය කර ඇත.

(2) සමහර සිසුන් විකුණුම් කොමිස් ගැලපුම නොසලකා හැර ශේෂ පිරික්සුමේ අගය පමණක් භාවිතා කළ අතර, බොහොමයක් අයදුම්කරුවන් එය නිවැරදිව ගණනය කර ආදායමක් ලෙස වැරදි ලෙස සටහන් කර තිබුණි.

(3) සමහර අයදුම්කරුවන් වර්ෂය සඳහා ක්ෂයවීම් නිවැරදිව ගණනය කර නොතිබුණි.

(4) වෙළඳසැල් කුලියට පෙරගෙවුම් කොටස සලකා බලා නොමැත. ගෙවන ලද සම්පූර්ණ මුදල ලාභ හෝ අලාභ ගිණුමට බැර කරන ලදී.

(5) අදාළ මාස තුනක කාලය සඳහා බැංකු ණය පොලිය ගණනය කර නොමැත.

(6) සමහර අයදුම්කරුවන් වෙළඳ ණයගැතියන් සඳහා වන ප්‍රතිපාදන වැරදි ලෙස ගණනය කර ඇති අතර, ආරම්භක සහ අවසාන ශේෂයන් මෙන්ම බොල් ණය සඳහා ගිණුම්ගත කිරීමට අපොහොසත් වී ඇත.

(b) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයඃ

(1) සමහර අයදුම්කරුවන් ජංගම නොවන වත්කම්වල ගොඩනැගිලි ශේෂයෙන් වෙන් වෙන්ව ඉඩම ඉදිරිපත් කර නොතිබුණි.

(2) සමහර අයදුම්කරුවන් වර්ෂය සඳහා ක්ෂයවීම ගිණුම්ගත කර නොමැති අතර අවසාන අගය ලෙස ශේෂ පිරික්සුමෙන් ලබාගත් සමුච්චිත ක්ෂයවීම භාවිත කර තිබුණි.

(3) අයදුම්කරුවන් විසින් කපා හරින ලද බොල් ණය සහ අඩමාණ ණය සඳහා දීමනාව අඩු නොකළ නිසා වෙළඳ ලැබිය යුතු දේ වැරදි ලෙස දක්වා ඇත.

(4) සමහර අයදුම්කරුවන් ජංගම වගකීම් යටතේ නිවැරදි උපචිත ණය පොලිය වාර්තා කර නොමැත.

- - -

**අයදුම්කරුවන්ගේ තේරුම් ගැනීම දියුණු කිරීමේ සැළකිල්ලට ගත යුතු සාමාන්‍ය කරුණුඃ**

1. **විෂය නිර්දේශයේ සම්පූර්ණ කරුණු හොඳින් අධ්‍යයනය කිරීම සහ සෑම ඒකකයකින්ම හෝ අංශයකින්ම අපේක්ෂිත දැනුම් මට්ටම පිළිබඳ මනා අවබෝධයක් දියුණු කර ගැනීම.**

2. **අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය කිහිපවතාවක්ම හොඳින් කියවිය යුතු අතර, සියලුම ගණනය කිරීම්වලට අදාළ පෙර වැඩ පැහැදිලිව පෙන්වා දැක්විය යුතුය.**

3. **උත්තර සැපයීමේදී උපකල්පනයන් අදාළ වන්නේ නම්, එම උපකල්පනයන් පැහැදිලිව දැක්විය යුතුය.**

4. **අත් අකුරු පැහැදිලි විය යුතු අතර ප්‍රශ්න අංකයන් නිවැරදිව දැක්විය යුතුය. උත්තර පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංක නැවත පරීක්ෂා කිරීම ආදී දේ අනිවාර්ය වේ.**

5. **ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.**

6. **අවබෝධය, කුසලතා සහ පළපුරුද්ද තියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න පත්‍ර සහ යෝජිත උත්තර උපකාරීවනු ඇත. සමාන රටාවන් සහ ව්‍යුහයන් නැවතත් ප්‍රශ්න පත්‍ර තුළ ඇතුළත් විය හැකි බැවින් එය සෑම විටම වාසිදායක වනු ඇත.**

7. **මෙම විෂයට අදාළව ස්ව-අධ්‍යන පොත සහ සඟරා මෙන්ම අදාළ විෂය කොටස් සඳහා අදාළවන අනෙකුත් කියවීම් පරිශීලනය කිරීම සිදු කරන්න.**

8. **කාල කළමනාකරණය විභාගයේදී ඉතා වැදගත් වේ. සෑම ප්‍රශ්නයකටම වෙන් කර ඇති ලකුණු දෙස බැලීමෙන්, උත්තර සැපයීමට වැය කළ යුතු කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් කළ හැකිය.**

9. **විභාගය සමත්වීමට තිර අදිටනින් යුතුව, මනා සූදානමකින් විභාගයට පෙනී සිටීම සිදු කරන්න.**

- * * * -